# 6

එක්වරම කාමරය විදුලි ආලෝකයෙන් ආලෝකමත් විය. මේසය මත තිබූ පහනත්, සිවිලිමෙහි වූ පහනත් දැල්වුණි. 'ලයිට් එන්නැති' උපසේන සිතුවේය.

නාන කාමර දොර කඩ සිටි පංචිමා, තුවා කඩකින් ඇගේ නිරුවත වසා ගත්තාය. ඇගේ කෙස් වැටිය තවම තෙතය.

උපසේනට තම කලිසම බිම වැටී ඇති සැටි පෙනුණි. ඔහු සැබෑවින්ම එය ඇඳ ගත්තේය. දෙදෙනාම හරියට ඊදන් උද්‍යානයෙන් පිටමං කරන ලද ආදම් සහ ඒවා මෙන් - නිරුවත වසා ගත් ඉක්මන! අන්ධකාරයේ සිටි යක්ෂයා පලා ගොසිණි.

උපසේන කමිසය ඇඳ ගනිද්දී පංචිමා යටින් තුවාය ගලවා ඇගේ ගවුම ඇඳ ගත්තාය.

ඈ දෙස බලන්නට උපසේනට උවමනා නොවීය.

"මෝ - පංචිමා - මම ගෙදර යන්න ඕනෑ!" ඔහු කීවේ අහක බලාගෙනය.

"ඔයා කවූ ඒක ඇදල දැම්මනේ?"

"මට කවු ගහන්න ඕන නෑ පංචිමා" ඔහු නැගිටිමින් ඈ දෙස බැලුවේය. "මේ සෙල්ලම ඇති - මම දැන් යන්න ඕනෑ"

"ඔයා කොහේ යන්නද උපා?" කී පංචිමා ඇඳ කෙළවර හිඳ ගත්තාය. "මං ආයෙ ඔයාට උදව් කරන්න, ඔයාට සුවයක් දෙන්න."

"දැන් ඉතින් සුවය ලැබුණනෙ?"

"ඔයා කොහේ යන්නද මේ රෑ වෙලේ?"

"මේ ඔයාගෙ බොස් - කා ළඟට කියල මාව මෙතනින් පිටමං කරන්න."

"මට ඒක කරන්න අවශ්‍යයක් නෑ උපා - මං මෙතන සේවිකාවක් විතරයි."

"ඒ උනාට මට ඒ මිනිහට කතා කරන්න ඕනා" උපසේන මදක් සැරෙන් කීවේය.

"මං මොනා කරන්නද?" ඈ ඇඬුම් බරවුවාය. "මං ආයෙ ඔයාට උදව්වක් කරන්න. ඇයි දෙයියනේ. වදින්න ගිය දේවාලෙ මගේ ඉහමම කඩාවැටෙන්න--"

"මේ- මේ ඔය කිඹුල් කටුඋල ඔත්තා ඒවා විහිදුගෙන --"

"පිරිමි ඔපෙරමයි -"

"ඔන්න කිව්වා, කාරුවක්!"

"මං ඔයාට වැරද්දක් කළාද? ඔයාට ශක්තිය දුන්නා - සනීප කෙරුවා"

"හරි- හරි දැන් ඊව, ලෝබෙ නරිනෙ.? ඔය කටුඋල එක විහිදුගෙන මාව මෙතනින් එළියට අරන් යන්න."

"මට ඒක කරන්න බෑ ටිනා" කී ඈ හිස නමාගෙන හඬන්නට වූවාය.

අනේ ඒ නර රේ ලස්සන ඇඳුම් අඳිනවා - මායට් හුට හතරක් තිරයෙනවා, කියනවනෙ. ඈ හික් හික් ගාමින් දෙදර ගස්සමින් හඬන්නේ දත් තල වලින් ඇස් වසා ගනිමින්.

හදිසියේම ඈ කෙරෙහි අනුකම්පාවක් ඔහු තුල උපන්නේය. ඇත් තමා මෙන්ම මේ වලේ වැටුණු ප්‍රාණියක් - තමා ඈගේ සිත දිනා ගත යුතුය.

ඔහු ඈ අසලින් ඇඳ මත හිඳගත්තේය. ඈගේ කතාව කුමක් විය හැකිද? ඈ මෙතනට ආවේ කෙසේද? ඈ තරක ප්‍රාණියක් විය නොහැකිය. ඈයත් තමාත් එකට ඇමලුණේ අවස්ථාව අනුවය. ඔවුන්ට ~~පෙළඹුණේ~~ පෙළඹුණේ මේ තනිවූ කාමරයයි - වසරයයි අඳුරයි. තමා හෝ ඈ ඒ පිළිබඳ වරදකරුවන් නොවේ. එය ස්වාභාවික සිදුවීමකි. ඈ මෙතනට ආ හැටි දැනගත්තොත්, ඈ හා කතාවෙන ඈට උදවු ගත හොත් තමාට ඈ හා පලා යා නොහැකිද? ඈ මෙතනින් යන එක බොලාවක් ඇති නොවේ..

ඈ අසලින් හිඳගත් උපසේන රතිමාගේ ඉකියෙන් ගැස්සෙන පිටට අත තැබුවේය.

"රත-රතිමා - රතිමා - අඬල වඩක්නෑ, මට ඔයාත් එක තරහක් නෑ - ඔයා මට ශක්තිය දුන්නා - ඔයා හොඳියක්."

රතිමා ඇඬුම නවතා එක්වනම උපසේන දිහා බැලුවාය. ඒ ඇසේ අවිනිශ්චිතතාවයක්, අසරණ භාවයක් විය. එහෙත් ඈ තවම නිහඬය.

"පරවිමා. ඔයා කොහොමද මේ වගේ තැනකට ආවෙ ?"

"ඇයි මෙතන නරකද?"

"නෑ - නරකත් නෑ"

"මෙතන- උපා මට හුඟ සැප නිදහසක්ම තියෙනවා. මට වෙන කොහේවත් යන්න ඕන නෑ."

"ම්... ඔයා මෙහේට එන්න කලින් කොහෙද හිටියෙ?" අනෝජ් අසන්නට දහසක් ප්‍රශ්න වෙයි.

"මං හිටියෙ - මං හිටියෙ වාද්දුවෙ - මං වැඩ කළේ කළුතර හොස්පිටල් එකේ."

"ඉතිං ? කොච්චර කල්ද මෙහේ ඇවිල්ලා ?"

"අවුරුදු තුනක්." ඈ කීවේ සැකයෙනි.

"අවුරුදු තුනක් ?"

"මට මතක වී වගේ."

"මතක වී වගේ ?"

"උපා මට දැන් කාල වකවානුවක් මතක නෑ, සමහරවිට අවුරුද්දක් දෙකක් වෙන්නැති. අවුරුදු හතක් වෙන්න ඇති."

"ඇයි එහෙම කියන්නෙ? ඔයාට මෙහේ ආව අවුරුද්ද මතක නැද්ද ?"

"ම්- හරියටම මතක නෑ. මං ඒවා, අමතක කරල දැම්මා."

"ඇයි ?"

"මට දැන් ඒවා වැඩක් නෑ උපා. ඒවා පහුගිය අතීතයක් විතරයි. ඒවා මතක තියන් ඉඳල වැඩක් නෑ"

"ඇයි ඒ ?"

"වැදගත් නෑ"

"ඔයාට පවුලෙ කවුරුවත් නැද්ද?"

"නංගි - බැඳල මිඩ්ල් ඊස්ට්."

"අම්මා - තාත්තා ?"

"අම්මා මැරිලා. තාත්ත වෙන කෙනෙක් බැන්දා."

"එතකොට ඔයාගෙ යාලුවො කවුරුවත් නැද්ද ?"

"නෑ - හිටියා. දැන් ඒ අය වැඩක් නෑ"

"ඔයා බලන්න එනවෙ නෑ ?"

"දැන් හිතන්නෙ නෑ."

"එහෙනං කලින් හිතුවා"

පංචිමා කීවාය.

"කවුරු ගැනද හිතුවෙ?"

"කවුරුවත් ගැන හිතුවෙ නෑ උපා.." ඈ මදක් කල්පනා කරමින් දෙවා පැවසුවාය.

"කවුරුවත් හිටියද?"

"එක බෝක්ට කෙනෙක් මගෙ ළඟටම ආවා - බඳින්න නෙමෙයි. දන්නවනෙ? අත පත ගාන්න."

"ඉතිං?"

"ඒ මිනිහට මං කැමති උනේ නෑ ඒ නිසාම මං වෙන කෙනෙක් එක්ක හාලු උනා"

"ඉතිං?"

"ඒ මිනිහා රටත් අන්තයි."

"ඉතිං?"

"ඒ අතරේ මට කාලිංගව මුණ ගැහුණා."

"කොහේදිද?"

"දවසක් - ගඟ සිරි පෝට්ලේදී."

"ගඟ සිරි පෝට්ලේද?"

"ඔව්! ඇයි?"

"නෑ. නෑ" මමත් එයාව මුණ ගැහුණේ එතැනදියි කියන්නට සිතුණත් උපසේන සිත වෙනස් කරගත්තේය.

"ඉතිං ඔයා කාලිංගත් එක්ක මේ ගන්දර කලපුවට ආවා?"

"ඔව්. ඒක තමයි මගේ ජීවිතේ සතුටුම දවස. මං එදා ජීවිතය ආඩම්බරට රස වින්දා - මට කවදාවත් නැති නිදහසක් ලැබුණා."

"නිදහසක් ලැබුණා?" මෝඩියෙ - උඹ දැන් ඉන්නෙ හිර ගෙදරක - කියන්නට උපසේනට සිතුණි. "පංචිමා ඔයාට මෙතනින් පිටවෙලා යන්න නිදහස තියෙනවද?"

"කොහෙ යන්නද? මේක මගේ මාලිගාව. මං මෙතන ආවදිනාවම හොර කම් කරනවා - වෙද කම් කරනවා, මට ඕන විදියට සතුටු වෙනවා. කෑම බීම ගන්නවා - විනෝද වෙනවා.

"එතකොට මෙන කොහේවත් යන්න හිතෙන්නෙ නැ ?"

"නැ උපා- මේක ලස්සන මාලිගාවක්. ලස්සන මල් උයනක්. කාගෙන්වත් මට කරදරයක් නැ. මට කැමති කෙනෙක් එක්ක මං..." කී ඈ නිහඬවූනාය.

"මට තේරෙනවා. ඔයාට ඇම සැපම තියෙනවා."

"හරියට හරි."

"ඉතින් ඔයාට පිටස්තර ලෝකය බලන්න ඕනැ නැද්ද? නගරය - මුහුද - ?"

"අනේ කලපුවෙ ඔරු පදිනවා. මෙහේ සාදයක උත්සව තියෙනවා. ළඟදිම නාව එකක් තියෙනවා. බලන්න කෝ."

"නැ මට ඉන්නෙ නැ. මම යනවා.."

"බලමු කෝ."

උපසේන නිහඬ විය. මේ ඇත්ත තේරෙන්නෙ නැද්ද? මම හෙටම යනවා. කලපුවෙ පීනගෙන හරි යනවා.

"පද්මා"

"ඕ ?"

"කලපුවෙ පීනන්න පුළුවන්ද ?"

"පුළුවන්" කී ඈ සිනාසුනාය. "හැබැයි කිඹුලො කන්න පුලුවන්."

"ඇත්තටම කිඹුලො ඉන්නවද ?"

"මං බොරු කියන්නෙ නැ උපා." කී පද්මා "මං බොරු කියන මිනිස්සුන්ට කැමති නැ" කීවාය.

"එතකොට කාලිංග.. කාලිංග බොරු කියන්නෙ නැද්ද ?"

"කාලිංග මොනවටද බොරු කියන්නෙ ? කාගෙන් මොනව ගන්නද ? එයා ළඟ ඇම දේම තියෙනවා. එයා වටේ ඉන්න මිනිස්සු සේරම එයාට ආදරෙයි. එයා කාටවත් මොනවත් අඩුවක් කරන්නෙ නැ. ඔයාට තේරේ උපා- පදු මෙන කොට."

"මං පදු මෙන කොට ඉන්නෙ නැ."

"පිස්සු දෙඩන්න එපා."

"පිස්සු ? පිස්සු නෙවෙයි. මං ගෙදර යන්න ඕනැ."

"කොහෙද උඹ ඔයාගෙ ගෙදර?"
"ගිරිහානෙ."
"හාං.. කවුද ගෙදර ඉන්නෙ?"
"මගෙ වයිෆ් - සුනා - පුතා බිමල්."
"බිමල් - ලස්සන නම."
"බිමල්ට දැන් අටයි."
"හා - ඉස්කෝලෙ යනවද?"
"විභාගෙ නැහැ. ගෙදර ඉන්නවා."
"හා -"

මේ මොන මගඩියක්ද? දැන් තමා පරීක්ෂණයක උත්තර දෙන්නා බවට පත්වෙලා!

"ඉතින් උඹ - හෙට ගෙදර යන්න. අද රාත්‍රිය සතුටින් සුවයෙන් ගතකරන්න."

"ඔයාට කියන්න ලේසියි -"

"ඔහොම ඉදලමෙන්න උඹ." කී පංචිමා උපසේනව පසුපසට තල්ලු කළාය.

උපසේනට යළි නිදිමත ගතියක් දැනුනි. මේ දැන් මායාකාරියක්ද?

පංචිමා ඈද කෙළවරෙන් නැගිට යළි කටු පෙට්ටිය අතට ගත්තාය. සිවිලිමේ විදුලි බුබුල නිවී ගියේය. මේසය මත පහන පමණයි. එය සියුමැලි එළියකි.

උපසේනට යළිත් දැනෙන්නේ තම සිරුර තුල ඇතිවෙන උත්තේජනයකි. තමා නොයා, යුතු තැනකට ඈ තමාව ගෙන යයි. තණ්හා - රතී - රාගා - මරගෙනන් තිදෙනාම ඈ තුළ. ඈ තමාව පොළඹවන සුක්ෂම ආකාරය. ඈ කොතරම් දක්ෂද? තමාට මුදලක් වැය නොවේ.

සිහින් සංගීතයක් කාමරයේ පුරා පැතිර යයි. එය සිත නොරඳනා රාගයකි -

පංචිමා උපසේනගේ කලිසම ඉවත් කරන්නේ සංගීතයට අනුකූලවය. ඈ ඇගේ ඇඳුම් උනන්නේද සංගීතයට අනුකූලවය.

මුළු ලෝකයම තමාගේ යයි උපසේනට සිතෙන්නට විය. රෝස මල් සුවඳ සිත වසා ගත්තේය.